# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.11.30 පැය 0745 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/2149/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු</u>

## 01. ෆේස්බුක් සාදයක් වටලා මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවන් තිස් දෙනෙකු හා සැකකාරියන් දෙදෙනෙකු අත්අඩංගුවට - වැලිකඩ පොලිස් ස්ථානය.

2025.11.29 වන දින දහවල් කාලයේ වැලිකඩ පොලිස් වසමේ ඇතුල්කොට්ටේ ප්‍රදේශයේ සිව් මහල් නිවසක පැවත්වූ ෆෙස්බුක් සාදයක් වටලා අයිස් මත්ද්‍රව්‍ය මිලිග්‍රෑම් 2630ක්, හැෂ් මත්ද්‍රව්‍ය මිලිග්‍රෑම් 1870ක් හා ගංජා මිලිග්‍රෑම් 3600 ක් සමග සැකකරුවන් 30 දෙනෙකු හා සැකකාරියන් 02 ක් අත්අඩංගුවට ගෙන ඇත.

සැකකාරියන් අවුරුදු 21 හා 22 වයස්වල පසුවන කුඹුල්ගොඩ හා කොළඹ 10 ප්‍රදේශයේ පදිංචිකාරියන් වන අතර සැකකරුවන් අවුරුදු 20 ත් 27 ත් අතර වයස්වල පසුවන කොළඹ හා වැල්ලම්පිටිය ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.

වැලිකඩ පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 02. මත්ද්‍රව්‍ය ජාවාරමට අනුබල දුන් සැකකරුවෙකු අත්අඩංගුවට - බේරුවල පොලිස් ස්ථානය.

2025.11.28 වන දින උදෑසන කාලයේ බේරුවල පොලිස් වසමේ ගොඩාතමල ප්‍රදේශයේදී බේරුවල පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 800 ක් සමග වයස අවුරුදු 28 ක් වන වෙත්තමරාජපුර ප්‍රදේශයේ පදිංචි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන 2025.11.29 වන දින ගරු කළුතර මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කර රැඳවුම් නියෝග ලබා ගෙන ඇත.

ඒ අනුව සිදු කරන ලද වැඩිදුර විමර්ශනයේදී 2025.11.29 වන දින දහවල් කාලයේ බේරුවෙල පොලිස් වසමේ මරදාන ප්‍රදේශයේදී මත්ද්‍රව්‍ය ජාවාරම සඳහා ආධාර අනුබල දීම සම්බන්ධයෙන් බෝට්ටු ස්කීපර්වරයෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 24 ක් වන බේරුවල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මත්ද්‍රව්‍ය ජාවාරම සඳහා යොදා ගත් බෝට්ටුවක්ද මේ වන විට හඳුනාගෙන ඇති අතර සැකකරු 2025.11.30 වන අද දින කළුතර ගරු මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කර රැඳවුම් නියෝග ලබා ගැනීමට නියමිතව ඇත. බේරුවල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කර ගෙන යනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**